නින්දවූර් ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
-----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 06 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට නින්දවූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

(අ) සමාලෝචිත වර්ෂයේදී JCB යන්ත්‍රය බාහිර කාර්යයන් සඳහා බදු දීම වෙනුවෙන් අදාල අයගෙන් අයවියයුතු රු. 739,500 ක මුදල ගිණුම්වල දක්වා නොතිබුණි.
(ආ) සභාවල ප්‍රදේශයේ තිබෙන කුණු කසල ඉවත්කිරීම වෙනුවෙන් 2013 වර්ෂය අවසානය දක්වා කාරතිවූ ප්‍රාදේශීය සභාවට ගෙවියයුතු රු. 312,075 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.
(ඇ) සභාවේ ස්ථාවර තැන්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ලද පොලී මුදල රු. 745,713 ක් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.
(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ තිබූ විදුලි උපකරණ තොගයේ වටිනාකම් රු. 218,438 සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.
(ඉ) 2013 සිට 2014 දක්වාවූ කාලපරිච්ඡේදයට අදාලව නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් ගෙන් ලැබියයුතු මුද්දර ගාස්තු රු. 10,245,676 ක් ගිණුම්වල දක්වා නොතිබුණි.
(ඊ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්ගෙන් අයවියයුතු උසාවි ගාස්තු රු. 1,353,668 ක් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.
(උ) 2014 දෙසැම්බර් 31 දිනට සභාවේ ස්ථාවර තැන්පත් ශේෂය රු. 1,384,249 ක් ගිණුම්වල රු. 805,582 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්
---------------------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1980 සිට 2012 වර්ෂය අවසානය දක්වා හිඟව තිබූ මස්කඩ බදු කුලිය රු. 3,173,466 ක මුදල අයකර ගැනීම හෝ අදාල පාර්ෂවයන්ට එරෙහිව නීත්‍යානු කූලව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතුකර නොතිබුණි.
(ආ) වීථි පහන් සඳහා විදුලි පාරිභෝජනයා වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවියුතුව තිබූ අවු. 21 කට වඩා පැරණි විදුලි ගාස්තුව වන රු. 2,951,150 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) 2007 වර්ෂයට පෙර ස්ථාන මාරුවී ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවියයුතු රු. 48,564 ක් සහ සෙවය හැර ගිය සහ මියගිය නිලධාරින් 21 දෙනෙකුගෙන් අයවියයුතු රු.

96,810 ක මුදල සහ මාරුවීගිය ආයතනයෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිකයයෙන් අයකර ගැනීම සඳහා 2015 මැයි 25 වන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---

තැන්පත් ගිණුමේ වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක සිට තිබෙන එකතුව රු. 742,110 ක කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 අනුව කටයුතුකර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 2,566,378 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන ආදායම් රු. 1,608,656 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,175,034 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

---

2.2.1 වෙළඳ බලපත්‍ර ගාස්තු

---

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ vii(8) සහ (xxx) උපවගන්තිය සහ 2014 ජනවාරි 17 වන දින 1846 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය අනුව සභා බල ප්‍රදේශයේ තිබෙන ව්‍යාපාර ස්ථාන 566 ක් වෙළඳ බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර ස්ථාන වලින් වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම වෙනුවෙන් ප්‍රචාරක ගාස්තු වශයෙන් අයවියයුතු රු. 580,675 ක් අදාල ව්‍යාපාර ස්ථානවලින් අයකර ගැනීම සඳහා 2015 මැයි 25 වන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) සන්නිවේදන කුළුනු ගාස්තු අයකිරීම්

---

2014 ජනවාරි 17 දින හා 1846 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2008 සහ 2009 වර්ෂවල ඉදිකරන ලද සන්නිවේදන කුළුනු 02 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයවියයුතු රු. 436,992 ක බලපත්‍ර ගාස්තු ප්‍රමාණය 2015 මැයි 25 වන දිනය දක්වා අයකර ගැනීම සඳහා කටයුතුකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ පිළිගැනීමේ කුළුනු (Gate way) ඉදිකිරීම් සඳහා විමධ්‍යගත අයවැය මගින් ලද රු. 592,500 ක මුදල ප්‍රයෝජනයට නොගෙන තැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

(ආ) කඩ කාමර 36 කින් යුතු නින්දවූර් වෙළඳ සංකීර්ණයේ කඩකාමර 19 ක් 2012 වර්ෂයේ සිට 2015 මැයි 25 දක්වා වසා තිබුණද, එම කඩ කාමර වල විදුලි ගාස්තු වෙනුවෙන් රු. 52,087 ක් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණි.

(ඈ) 2012 වර්ෂයෙ සිට 2014 වර්ෂය අවසානය දක්වා සභාව සතු JCB යන්ත්‍රය බාගිර පාර්ෂවයන් හට බදු දීම වෙනුවෙන් ලැබියයුතු රු. 1,540,390 ක මුදල බදුකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ අදාල පුද්ගලයින්ට එරෙහිව නීත්‍යායානුකූලව කටයුතු කිරීමට 2015 මැයි 25 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන මාර්ග 38 ක භාෂා තුනෙකින් නාම පුවරු ප්‍රදර්ශන කිරීම සඳහා රු. 980,400 ක් ගෙවීම් කර තිබුණ නාම පුවරු සකස් කරන ආයතන වලින් සහ අදාල නිලධාරින් ගෙන් සෘජුව විගණන විසින් ලබා ගත් තොරතුරු අනුව මෙම නාම පුවරු සඳහා රු. 539,030 ක මුදලින් සකස්කළ හැකිය. මෙම ක්‍රියාවෙන් සභාවට රු. 441,370 ක පාඩුවක් සිදුවී තිබුණි.

3.2 වාහන උපයෝජනය

----------------------

සමාලෝචිත වර්ෂයේදී වාහන 13 ක් සභාව විසින් ධාවනයට යොදවා ඉන්ධන වියදම් සහ නඩත්තු වියදම් වශයෙන් රු. 2,833,695 ක් වැයකර තිබුණි. මෙම වාහනවල උපයෝජනය පිළිබඳ
පහත කරුණු නිරික්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වාහන හතරක් සඳහා මාසික ඉන්ධන සාරාංශ සහ ඉන්ධන පාරිභොජනය පිළිබඳ පරීක්ෂා නොකර ලීටර් 5432 ක් වෙනුවෙන් රු. 640,976 ක ඉන්ධන ලබාගැනීම සඳහා ඉන්ධන ඇණවුම් නිකුත්කර තිබුණි.

(ආ) අංක RB – 1530 දරණ ට්‍රක්ටර් රථය සමාලෝචිත වර්ෂය ජුනි මාසයේ අළුත්වැඩියා කිරීම් කටයුතු නිසා ධාවනයේ යොදවා නොතිබුණද, එම කාලපරිච්ඡේදය අදාලව ඩීසල් ලීටර් 25 ක් රු. 15,283 කට මිලදී ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී RB – 1530 ට්‍රක්ටර් රථය අපද්‍රව්‍ය ඉවත්කිරීමේ කාරයයන් සඳහා යන්ත්‍ර පැය 106 කට යොදවා තිබුණද, යොදවාගත් බවට සටහන් වාහන ධාවන සටහන් වල සටහන් කර නොතිබුණි.

(ඈ) 2014 ජනවාරි 01 දින සිට 2014 පෙබරවාරි 12 දින දක්වාවූ කාල පරිච්ඡේදයේදී NA – 0125 අංක දරණ වාහනය යන්ත්‍ර පැය 106 කට යොදවා ගැනීම සම්බන්ධව ධාවන සටහන් සහ ඉන්ධන පරිභෝජනය සාරාංශ විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණද ඉදිරපත් කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

2013 වර්ෂයේ සභාව විසින් නිෂ්චිත විශේෂ පළාත් සංවර්ධන ආධාර සැලස්ම යටතේ මිලදී ගෙන තිබූ රු. 299,965 ක් වටිනා 35,290 කුණු එකතු කරන බෑග්වලින් බෑග් 33,878 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ තිබුණු බව නිරීක්ෂණ විය.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගත යුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 වන දිනය හා අංක 03 දරණ පළාත් පාලන ප්‍රතිසංස්කරනය පිළිබඳ චක්‍රලේඛයේ 8 වන ඡේදයෙන් පෙන්වාද තිබු පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) කළමනාකරණ පාලනය

(ඈ) වාහන උපයොජනය